**හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) පීඑල්සී -2017**

------------------------------------------------------------

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) පීඑල්සී හි (සමාගම) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

--------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("අධ්‍යක්ෂ මණ්ඩලය") වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

----------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

-------------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) පීඑල්සී හි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.1.1 අවධාරණය කළ යුතු කරුණු

---------------------------------------

සමාගම විසින් අඛණ්ඩව භාවිතා කරන පිරිවැය රු.1,986,019,251 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් පිළිබඳ විස්තර කෙරෙන මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 12.3 ට මම අවධානය යොමු කරවමි. සමාගම වරලත් තක්සේරුකරුවෙකුගේ සහාය සහිතව තනි සහ සෑම වත්කමකම විස්තරාත්මක වත්කම් සත්‍යාපනයක් සහ තක්සේරුවක් සිදුකර තිබෙන අතර එම පැවරුම එහි අවසන් සැසඳුම් අදියරට පැමිණ තිබුණි. මෙම කරුණ සම්බන්ධයෙන් මාගේ මතය තත්ත්වාගණනය කරනු නොලැබේ.

### 2.1.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවය පිළිබඳ වාර්තාව

-------------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තියෙහි අවශ්‍ය පරිදි පහත සඳහන් කරුණු දක්වමි.

අ. මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය හා සීමාකිරීම් ඉහත පරිදි දක්වනු ලැබේ.

ආ. - විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත් මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151 වගන්තියේ අවශ්‍යතාවන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

පහත අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

**(අ)** ඉවත් කරන ලද වත්කම් වලින් ලද රු.6,619,751 ක මුදල වාර්තා කර තිබුණ ද, එයට අදාළ පිරිවැය සහ සමුච්චිත ක්ෂය සමාලෝචිත වර්ෂයේදී ගිණුම් පොත් වලින් ලියා හැරීමට කටයුතු කර නොතිබුණි.

**(ආ)** දින 150 ට වඩා හිඟව පැවති ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් ලැබිය යුතු රු.3,236,129 ක වටිනාකමට අදාළව අපහායන සඳහා වෙන්කිරීම් සිදුකර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් කටයුතු වලින් වූ මූල්‍ය ප්‍රතිඵලය රු.172,976,000 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව පසුගිය වර්ෂය සඳහා රු.172,945,000 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.31,000 ක වර්ධනයක් දැක්වුණි. සමාලෝචිත වර්ෂයේදී ආදායම රු.474,682,000 කින් වර්ධනය වුවද, ක්ෂය සහ පරිපාලන වියදම් කැපී පෙනෙන ලෙස වර්ධනය වීම මූල්‍ය ප්‍රතිඵලයේ සුළු වර්ධනයට බලපෑ ප්‍රධාන හේතුව වී තිබුණි.

සමාගමේ මූල්‍ය ප්‍රතිඵල විශ්ලේෂණය කිරීමේදී, 2013 සිට 2017 දක්වා වූ පසුගිය වර්ෂ හතරෙහි සහ සමාලෝචිත වර්ෂයේ අගය එකතුවීම උච්චාවචනය වී තිබුණි. වැටුප්, බදු හා ක්ෂය අයකිරීමෙන් පසු 2016 සහ 2017 වර්ෂවල අගය එකතු කිරීම පිළිවෙලින් රු.1,565,701,000ක් සහ රු.1,112,222,000ක් විය.

### 3.2 විග්‍රහත්මක මූල්‍ය සමාලෝචනය

-----------------------------------

#### 3.2.1 වැදගත් ගිණුම්කරණ අනුපාත

----------------------------------

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සමාගමේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| | 2017 | **2016** |
|---|---|---|
| දළ ලාභ ආන්තිකය (%) | 81.73 | 82.65 |
| දළ ලාභ අධිකය (විකුණුම් පිරිවැය මත දළ ලාභය) % | 447.42 | 476.51 |
| ශුද්ධ ලාභ අනුපාතය (%) | 5.74 | 6.81 |
| බීම පිරිවැය ප්‍රතිශතය (%) | 0.32 | 0.16 |
| පිරිවැටුම මත මූල්‍ය පිරිවැය (වාර ගණන) | 0.003 | 0.001 |
| තොග පිරිවැටුම (වාර ගණන) | 10.06 | 10.38 |
| ආහාර තොග පිරිවැටුම (වාර ගණන) | 56.27 | 31.38 |
| ජංගම අනුපාතය | 0.86:1 | 1.18:1 |
| ක්ෂණික අනුපාතය | 0.80:1 | 1.12:1 |
| සැපයීම සඳහා තබාගෙන ඇති කාමරයක ආදායම (රු.) | 12,014 | 10,966 |
| කාමරයක සාමාන්‍ය රේටය (රු.) | 21,077 | 28,968 |

ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ දළ ලාභ අධිකය, ශුද්ධ ලාභ අනුපාතය හා දළ ලාභ ආන්තිකය පිළිවෙලින් සියයට 29.09 , සියයට 1.07 සහ සියයට 0.92 කින් අඩු වී තිබුණි.

### 3.2.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

----------------------------------------

සමාගමේ ජංගම වත්කම් සහ ජංගම වගකීම් විශ්ලේෂණයේ දී 2013 සිට 2016 දක්වා ධනාත්මකව පැවතුණු කාරක ප්‍රාග්ධන තත්ත්වය 2017 වර්ෂයේ දී රු.119,898,000 ක සෘණාත්මක අගයකට වෙනස් වී තිබුණි. එමනිසා, සමාගමේ කාරක ප්‍රාග්ධන කළමනාකරණය ඉතා දුර්වල මට්ටමක පැවතුණි. එසේම, 2013 වර්ෂයේ පැවතුණු රු.4,678,851 ක සෘණාත්මක ණය ගෙවීමේ ආන්තිකය සමාලෝචිත වර්ෂයේ දී රු.6,433,127 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

------------------------------------------

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/12 ප්‍රකාරව, සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2018 පෙබරවාරි 28 දින හෝ ඊට පෙරාතුව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේවුවද, 2017 වර්ෂය සඳහා සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2018 ජුනි 01 දින විගණනයට ඉදිරිපත් කෙරුණි.

### 4.2 සංයුක්ත සැලැස්ම

------------------------

2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/12 හි නියෝග ප්‍රකාරව වසර තුනකට අඩු කාල පරිච්ඡේදයක් සඳහා වූ සංයුක්ත සැලැස්මක් සමාගම විසින් පිළියෙල කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා සමාගමේ සභාපතිගේ අවධානයට යොමුකරන ලදී. වත්කම් කළමනාකරණය සහ ණයගැති පාලනය සම්බන්ධයෙන් සමාගමේ විශේෂ අවධානය යොමු කෙරේ.